**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ජූලි මස 02 වන දින සිට ජූලි මස 08 වන දින දක්වා**

**දේව වචනය අසා පිළිපැදීමේ අවසාන පරමාර්ථය වන්නේ දේවාශිර්වාදය භුක්ති විඳීමයි**

01. ප්‍රශංසාව සඳහා :

- * ශු.ලූක් 10:21 "ඔවුන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී උදන් අනමින් ස්වර්ගයටත්, පොළොවටත් අධිපති වූ පියාණෙනි, ඔබ මේ දේවල් පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ බැවින් ඔබට තුති පුදමි...."
- * ක්‍රිස්තුන් වහන්සේ මෙසේ අප වෙනුවෙන් තම පියාණන්ට තුති පැසසුම් පුද කළේ දේව වචනය හා කැමැත්ත මගින් තමන් වහන්සේව අනාවරණය කිරීම පිණිස අපව තෝරා ගෙන, කැඳවා ගත් බැවිනි.
- * අපිදු මේ මොහොතේ ක්‍රිස්තුන් වහන්සේ සමගින් පියාණන් වහන්සේට, අප ලබා ඇති කැඳවීම වෙනුවෙන් තුති ප්‍රශංසා කරමු.
- * පුබුදු ගී 129 "පූර්ණයාණෙනි ඔබ දකින තුරා...."

02. සුපුවත සඳහා හැඳින්වීම :

(අ) දේව වචනයට සවන් දීම පමණක් නොව, ඒ තුළ ජීවත් වෙමින් ප්‍රායෝගික වීමේ අවශ්‍යතාවය ගැන ක්‍රිස්තුන් වහන්සේ අපට අවධාරණය කරන සේක. නිරතුරුවම දේව වචනයට විවෘත වෙමින්, වචනය පිළිපැදීම කුමන ආශිර්වාදයක්ද, භාග්‍යවන්ත කමක්දැයි ක්‍රිස්තුන් වහන්සේද, භාග්‍යවන්ත අම්මා ද අපට ජීවිත ආදර්ශය මගින් සනාථ කළා නොවේද?

(ආ) ශුද්ධ ලියවිල්ල දෙස - මෙහි පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ කියවා ඉහත සඳහන් කාරණය පිළිබඳව කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න.

i ශු.ලූක් 11:27-28 "ඔබ දැරූ කුසය ද, ඔබට කිරි දුන් පියයුරු ද භාග්‍යවන්තය"යි ඔවුන් වහන්සේට කීවාය.

ii ශු.ලූක් 8:21 එහෙත් ඔවුන් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, "මාගේ මෑණියොත් මාගේ සහෝදරයෝත් ......."

iii ශු.ලූක් 12:49-53 "පොළොව මත ගිනිලන්න ආවෙමි....."

iv යෙසායා 55:10-11 "අහසින් වැටෙන හිම හා වසින වැස්ස..... මා මුවින් නික්මෙන වචන මා වෙත හිස්ව නොපැමිණ..."

03. වචනයේ සේවකයා සඳහා:

- * ක්‍රිස්තුන් වහන්සේ මේ වදන් පැවසීමෙන් අවධාරණය කළේ මේ ලෝකය තුළ සමාජ මට්ටමින් පවතින මිනිස් සබඳතා, ඥාති සම්බන්ධකම්වලට වඩා ආත්මික සම්බන්ධකම වඩා වැදගත් වන බවයි. ශ්‍රේෂ්ඨවන බවයි. එනම් සාමාන්‍ය වශයෙන් මනුෂ්‍ය ආදරය මුල් කරගෙන, හැඟීම් මත මනුෂ්‍යන් අතර සබඳකම් අභිබවා, ක්‍රිස්තුන් වහන්සේ අපට අනාවරණය කල, අත්දකින්නට සැලසූ දේව ප්‍රේමයේ සම්බන්ධකම් උත්තරීතර වන බවයි.
- * දේව රාජ්‍ය මිහිපිට ස්ථාපිත කිරීමේ පිපාසය ඔවුන් වහන්සේ තුළ ගින්නක් සේ ඇවිලී තිබූ බව ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළ සේක. ශුද්ධවූ ගින්නෙන් පොළෝ තලයම අළුත් කොට දේව රාජ්‍යයේ ස්වභාවය මිනිස් වර්ගයා භුක්ති විඳිනු දැකීම ඔවුන් වහන්සේගේ හදවත තුළ තිබූ අධිකතර පිපාසයයි. ඒ සඳහා බව්තිස්මයක් ලබන තුරු ක්‍රිස්තුන් වහන්සේ අධිකතර පිපාසයෙන් බලා සිටි සේක. ඒ ශුද්ධවූ මොහොත එළෙඹෙන තුරු ඔවුන් වහන්සේට ඉස්පාසුවක් නොවීය. ඒ බව්තිස්ම ස්නාපනය නම් ඔවුන් වහන්සේගේ දුක් විඳීමයි. කුරුසිය මත දිවි පිදීමයි. ඒ මගින් මිනිසුන් අතර හදවතේ සම්බන්ධතාවයක් ඇති කරමින්, පවුල තුළ - සමාජය තුළ - පොළෝ තලය මත නව ජීවන යුගයක් ඇති කළ සේක.
- * පැරණි ගිවිසුමේ පටා දෙවි සමිඳාණන්ගේ කැමැත්ත වූයේ මෙලෙස තම පුත්‍රයාණන් මගින් සැබෑ හෘදයාංගම ප්‍රේමයේ ගින්නක් මිනිසාගේ හදවත් තුළ දැල්වීම මගින් තමන් වහන්සේගේ කැමැත්ත ඉටු කරලීමයි. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ අප අතරට මනුෂ්‍ය ආකාරයෙන් වැඩම කරමින් පියාණන්ගේ කැමැත්ත පූර්ණ ලෙස ඉටුකළ සේක.

04. එහෙයින් දේව වචනය මගින් නිරන්තරයෙන්ම අනාවරණය වන දේව කැමැත්තට අවදි නොවීමේ පාපය හා විපාකය වෙනුවෙන්, සමිඳාණන් ඉදිරියේ මොහොතක් පෙනී සිටිමින් මනස්ථාපනය වෙමු.

(අ) පෞද්ගලික ජීවිතය තුළ, පවුල් ජීවිතය තුළ, සංඝය තුළ, සමාජය තුළ දේව හඬට සවන් නොදී කටයුතු කළ අවස්ථාවන් සිහිපත් කර ගනිමු.
(ආ) දේව හඬට සවන් දීමට වඩා ඒ මගින් දේව කැමැත්ත සොයමින් එය ඉටු කරලන්නට අප තුළ තිබෙන බැරිභාවය , අතපසු කිරීම්, අලසකම යනාදි බාධාවන් හඳුනා ගනිමු.
(ඇ) අප තුළ වූ මෙම පාපතර ස්වභාවය හඳුනා ගෙන, පිළිගෙන අවංකව පසුතැවිලි වී සමිඳුන් වෙත අපගේ සිත් හරවා ගනිමු.
(ඈ) පුබුදු ගී අංක 227 "හැරෙනා පිණිස ...."

05. අපි යාච්ඤා කරමු.
මෙතැන් පටන් දේව වචනයට නිරතුරුවම විවෘතව සිටින්නට බලය පතා යාච්ඤා කරමු.
ශුද්ධාත්ම ගින්නෙන් අපව දල්වන්න කියා යාච්ඤා කරන්න.
"සුදත් ගින්නෙන් දැවෙමු දැන් ...."

06. සතිය පුරා ප්‍රායෝගිකව:
* අන් අය සමඟ අපගේ ජීවිත අත්දැකීම් බෙදා ගනිමින් සුභාරංචියට සාක්ෂි දරමු.

========================

**ප්‍රශංසා එකතු සුපුවත**
**2018 ජූලි මස 09 වන දින සිට ජූලි මස 15 වන දින දක්වා**

**යාච්ඤා ජීවිතය තුළින් දේව කැමැත්ත ඉටු කිරීමට පිපාසා වෙමු**

01. ප්‍රශංසාව සඳහා:
* ශු.ලූක් 6:12-13 "ඔවුන් වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැගී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක. පහන් වූ කල ඔවුන් වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවා ඔවුන් අතරින් දොළොස් දෙනෙකු තෝරා ගෙන ඔවුන්ට ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක."
* ජේසුස් වහන්සේ කන්දකට නැගුනේ ප්‍රේරිතයන් තෝරා ගැනීම පිණිස නොව රැය පහන් වනතුරු යාච්ඤා කිරීම සඳහායි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේගේ යාච්ඤාව තුළ තම පියාණන්ගේ කැමැත්ත ඉටු කරමින් ප්‍රේරිතවරුන් දොළොස් දෙනෙකු තෝරා ගත් සේක.
* දේව කැමැත්ත අනාවරණය වීමේ පදනම ගැඹුරු යාච්ඤා ජීවිතයයි. එහෙයින් සංඝයක් ලෙස යාච්ඤාවේ යෙදෙන මොහොත ඉතා ගාම්භීරවූ, උත්තරීතරවූ මොහොතකි. දේව වචනය හා දේව කැමැත්තට විවර වන, ශුද්ධාත්ම ගින්නෙන් දැවෙන මොහොතකි. දේවාශිර්වාදය භුක්ති විඳින මොහොතකි.
* අපි සාංඝික වෙමින්, සමිඳාණන් වහන්සේ අභියසට ගමන් කරමු.
* පුබුදු ගී 131 "පුරා හදවතින් ...."

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගනිමු.
* කෙටි ප්‍රශංසාවකින් පසු සුපුවත බෙදා ගන්න.

03. සුපුවත සඳහා හැඳින්වීම :
(අ) දේව වචනයටද, දේව කැමැත්ත සොයන්නට ද සමිඳාණන් වහන්සේ අප හදවත් තුළ පිපාසයක් ඇතිකරලීම මොන ආශිර්වාදාත්මක භාග්‍යවන්ත කමක්ද? එබැවින් බෞතිස්ම ස්නාපනය මගින් අප ලබා ඇති මෙම අනුග්‍රහය, වරප්‍රසාදය කරණකොට ගෙන නිරන්තරයෙන්ම තුති ප්‍රශංසා කළයුතු අතර, මෙම ශුද්ධවූ කැඳවීමට පිළිතුරු දීමට සිත අවදියෙන් තබා ගත යුත්තෙමු.
(ආ) පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ කියවා භාග්‍යවන්ත අම්මා මෙන්ම ජුසේ තුමාද ජීවිත සිද්ධීන්, අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ දේව කැමැත්තට පිළිතුරු දුන් අයුරු බෙදා ගන්න. සාකච්ඡා කරන්න.

i ශු.ලූක් 1:34 "එවිට මරිය තුමිය දේව දූතයාට කථා කොට මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ සිදුවිය හැකිදැයි ඇසුවාය."
ii ශු.මතෙව් 1:19 "ඇගේ ස්වාමි පුරුෂයා වන ජෝශප් සත් පුරුෂයෙකු වූ බැවින්, රහසින් ඇය අත්හැර දමන්නට සිතා ගත්තේය. "
iii ශු.මතෙව් 2:13 "සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින්, ජෝශප්ට දර්ශනයවී ඔහු අමතා..."
iv ශු.මතෙව් 2:19 "සමිඳාණන් වහන්සේගේ දූතයෙක් මිසරයේදී ජෝශප්ට දර්ශනය වී ඔහු අමතා...."

04. වචනයේ සේවකයා සඳහා :

* මෙවැනි ජීවිත සිද්ධීන් හමුවේ භාග්‍යවන්ත අම්මාට මෙන්ම ජුසේ තුමාටද එකවරම සමිඳාණන් වහන්සේගේ වචනය හා කැමැත්ත හමුවේ එකවරම අවබෝධ කර නොගන්නට ඇති. මන්ද සමිඳාණන්ගේ කැමැත්ත හුදෙක් මනුෂ්‍ය බුද්ධියට ගෝචර නොවිය හැකියි. එහෙත් ඒ සිදුවීම් සියල්ල භාග්‍යවන්ත අම්මා සිත්හි නිදන් කරගෙන මෙනෙහි කරද්දී ශුද්ධාත්මයාණන් වහන්සේ එතුමියට ආලෝකයේ වචනය අවබෝධ කර දුන් බව නිසැකය. මන්ද ඕතුමිය මුළුමනින්ම දෙවි මහෝත්තමයාණන් කෙරෙහි විශ්වාස කළ හෙයිනි.
* ශුද්ධවූ පවුලක් ලෙස මුළු මිනිස් වර්ගයා වෙනුවෙන්ම කැඳවා ගනු ලැබූ භාග්‍යවන්ත අම්මා ද, ජුසේ තුමාද ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ ගැඹුරු යාච්ඤා ජීවිතයක් ගත කළ බව ඉතා පැහැදිලිය.
* ජෝශප් සත් පුරුෂයෙකු බැවින්.... යනුවෙන් ශුද්ධ ලියවිල්ලේ ප්‍රකාශ කිරීම මගින් එතුමන් තුළ මොනතරම් ප්‍රේමයේ ස්වභාවයක් තිබෙන්නට ඇද්ද? දේව ධර්මිෂ්ඨකම යනු සමිඳාණන් වහන්සේ කෙරෙහි ඇති පිරුණු විශ්වාසයයි.

05. අප දෙස :

* ගැඹුරු මනස්ථාපනයකට අපි ඇතුළු වෙමු. ඔබ/මම ජීවත් වන මෙම විෂම සමාජය තුළ අප නැඹුරු වී සිටින්නේ, ඇලී ගැලී සිටින්නේ කුමන දේවලටදැයි සිත් සෝදිසි කර බලමු.
* අප තුළ තිබෙන පාපිෂ්ඨ තත්ත්වයන් මොනවාද? අප ඇලී ගිලී සිටින්නේ මොනවාටද? ජංගම දුරකථන, මුහුණු පොත, පරිඝනකය .... යනාදි දේවල්.
* අපගේ ආත්මික පිපාසය හීන වී ඇද්ද?
* අපගේ සැබෑ තත්ත්වයන් අවබෝධ කරගෙන අපි සමිඳාණන් නමදිමු.

06. සතිය පුරා :

කොලොස්සි 3:16 මෙම ශුද්ධ ලියවිලි පාඨය කියවා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ දේව හඬට සවන් දෙමු.

========================

**ප්‍රශංසා එකතු සුපුවත**
**2018 ජූලි මස 16 වන දින සිට ජූලි මස 22 වන දින දක්වා**

**'ඇවිලෙමින්, අවුලන ශුද්ධාත්ම ගින්න'**

01. ආරම්භක ප්‍රශංසාව :

* පුබුදු ගී අංක 223 "ශුද්ධාත්මයාණෙනි වඩින්න රැගෙන ගින්න...."
* දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 14:16-17 ජනතාව එයට ඇතුළු කරන්න.
  ලෝකයා නොදකින, නොහඳුනන දේව ආත්මයාණෝ අප තුළ සදහටම නැවතී වැඩ වසනවා. ඒ ශුද්ධාත්මයාණන් අප වෙත දානය කරන පිණිස සමිඳාණන් නිරන්තරයෙන් පියාණන් වහනසේගෙන් අයදිනවා. අප කුමන තත්ත්වයක සිටියත් අපව කිසිවෙකුට අගයක්, අවශ්‍යතාවයක් නොවූවත්, සමිඳාණන් වහන්සේ ඒ නොවටිනා අප වෙනුවෙන් "ඔබ සමඟ සදහටම වැඩ සිටිනු පිණිස වෙන සහයදායකයෙකු දෙන සේක" යයි යදිනවා. අප මොන තරම් වාසනාවන්තද? එය අපට පිළිගත හැකිද? අපට ඒ වෙනුවෙන් කළ හැක්කේ කුමක්ද?
* අපට කළහැකි එකම දේ ඔවුන් වහන්සේ පැසසීම, මහිමය වැනීම පමණි. එම නිසා අප ගැඹුරු ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

02. දවසේ සුපුවත :

* ගින්න හරිම භයානක දෙයක් ලෙසයි සාමාන්‍ය පිළිගැනීම. ගින්න දෙයාකාරයි.
  i බාහිරව ඇවිලී දක්නට ලැබෙන ගින්න
  ii ඇතුලාන්තයේ ඇවිලෙන ගින්න

  බාහිර ගින්න භයානක වන්නේ එයින් ජීවිත විනාශ වීම හේතුවෙනි. ජීවිත පමණක් නොව මිනිසා සතු බාහිර ඕනෑම දෙයක් එයට වනසාලිය හැක. එහෙත් බාහිර ගින්න මිනිසාට අත්‍යවශ්‍ය දෙයකි. ආහාර පිසීම, උණුසුම රැකගැනීම, අපිරිසිදු දෑ පිරිසිදු කර ගැනීමට ගින්න උපකාරි වේ.
* පියවි දෙනෙතට හසුනොවුවද ඇතුලාන්ත ගින්න පුදුමාකාර බලවේගයකි. ඒ ඇතුලාන්ත ගින්නට සැබෑ ලෙසින් ඇවිලීමට ඉඩහලහොත් කිසිවකට නිවාලිය නොහැක. මේ ගින්න අවුලනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේමය. කිසිවකට අපගෙන් ඈත්කළ නොහැකි ඒ ගින්න දේව ආදරය ලෙස හඳුන්වා දෙනවා.
* පුරාණයේ සිටම දෙවියන් වහන්සේ තමන් තෝරා ගන්නවුන් තුළ මේ ශුද්ධාත්ම ගින්න ඇවිලෙව්වා. කුමන දුබලකම් පැවැතියද දෙවියන් වහන්සේ ජුදා ජනතාව තුළ මේ ගින්න අවුළවනු ලැබුවා. ඔවුන් ඒ ගමන දුර්වල කරගන්නා විට දිවැස්වරුන් ඔවුන් වෙත යවමින් නැවත නැවත එම ගින්න බලවත් කළා. ආබ්‍රහම්, මෝසෙස්, දාවිත් වැන්නවුන් තුළින් දෙවියන් වහන්සේ මේ ගින්න නිවීයාමට ඉඩ නොතබමින් දිගින් දිගටම ඇවිලීමට ක්‍රියා කළ සේක.
* භාග්‍යවත් මාතාවන් වෙත සුරදූතයා යවමින් මේ ගින්න ඇවිලීමට සැලැස්සුවා. එක්වරම මේ ගින්න එතුමිය තුළ ඇවිලීමට ඉඩ හැරීමට අපහසු වුවද, මනුෂ්‍ය දියණියක් ලෙස දේව අම්මා ශුද්ධාත්මයාණන්ට ඉඩ දෙමින් ගින්න තමන් තුළ ඇවිලීමට ඉඩ ලබා දුන්නීය. ඒ ඉඩහැරීම ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවන තැනැන් වහන්සේට තම කුස තුළම ඕතොමෝ ඉඩ සැලැස්විය. එලිසබෙත් තුමිය බැහැදැකීමට ඇයගේ නිවසට ගිය මොහොතේ භාග්‍යවත් මාතාවන් තුළවූ ගින්න එලිසබෙත් තුමිය තුළට පමණක් නොව ඇයගේ කුසඹත් දරුපලය වූ ජොහාන් තුමන් තුළද දල්වනු ලැබුවාය.
* ජෝර්දාන් නදියේදී සමිඳාණන් වහන්සේ තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ඇවිළු ගින්න සේනාකුළු මන්දිරයේ ශ්‍රාවකයන් තුළද අවුලමින් ලෝකාන්තිමය දක්වාම එය ඇවිලීමට ශුද්ධාත්මයාණන් වහන්සේම ක්‍රියා කරන සේක.
  (ශුද්ධාත්ම ගින්න ඒ ඒ යුගයන්හිදී ඇවිළුනු අයුරු සාකච්ඡා කරන්න)

03. සතිය පුරා :

* අප සැමද ශුද්ධාත්ම ගින්නට දැනුවත්වම හසුවූවන් වෙති. එහෙත් එම ගින්න අප තුළ ඇවිලීමට ඉඩ සැලසීමට අපගේ දායකත්වය කෙසේදැයි නිතර මෙනෙහි කරමු.
* ශුද්ධාත්ම ගින්න අවුළුවා ගනිමින්, එය ආශිර්වාදයක් කර ගැනීමට වරම් පතා යාච්ඤා කරමු.

04. අවසන් ප්‍රශංසාව : පුබුදු ගී අංක 49 "යන්න සැරසෙමු...."

=====================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ජූලි මස 23 වන දින සිට ජූලි මස 30 වන දින දක්වා**

**"නිවිය නොහැකි ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුනු ජීවිත තුළින් විහිදුනු ආලෝකය"**

01. ආරම්භක ප්‍රශංසාව:
    පුබුදු ගී අංක 10 "ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ ...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :
    "මන්ද යම් තැනක දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් මාගේ නාමයෙන් රැස්ව සිටිත්ද, එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි." (ශු.මතෙව් 18:20) අප මැදට සමිඳානණ් වහන්සේව කැඳවීමේ විශේෂ බලයක් අපට ලැබී ඇත. අප එකමුතුවන තැන, එක්සිත්වන හැම මොහොතකම ඔවුන් වහන්සේ අප මැද වැඩ වසන සේක. සමිඳාණන් වහන්සේව අප මධ්‍යයට කැඳවා ගන්නට නම් අපි එකමුතු විය යුතුයි.

මොහොතක් අපගේ දෙනෙත වසාගෙන අවදි වී බලමුද මේ දැනුත් මට එකමුතු වෙන්නට බැරි, සමාව දෙන්නට බැරි, ප්‍රේම කරන්නට බැරි කී දෙනෙක් ඉන්නවද කියලා. ඒ අයව නමින් මතක් කර ගනිමු. චිත්‍රගතව දකිමු. හදවතින් ඒ අය ළඟට යමු. මට සමා වෙන්නට කියා හදවතින් කියමු. මට සමාව දෙන්නට කියා හදවතින් සමාව ඉල්ලමු. අපට කළ නොහැකි, එහෙත් සියල්ල කළහැකි සමිඳාණන් වහන්සේ මේ මොහොතේ අප සමඟ බව විශ්වාස කරමින් මේ අභ්‍යාසයට ඇතුළු වෙමු. සමාව දීමෙන්, සමාව ලැබීමෙන් අප අත්දුටු ප්‍රීතිය, නිදහස මුල් කරගෙන ප්‍රශංසාවට ඇතුළු වෙමු.

පුබුදු ගී අංක 19 "අප ජීවනයද ..... "

03. දවසේ සුපුවත : එපීස 1:4-5 (පොදුවේ ප්‍රකාශ කරන්න)

"..... ප්‍රේමයෙන් ඔවුන් වහන්සේ ඉදිරියේ අප ශුද්ධවූ නොකැළැල්ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ අප තෝරා ගත් සේක. තවද ස්වකීය ප්‍රසාදය හා අරමුණ අනුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන ඔවුන් වහන්සේ අප දරුකමට පිළිගන්න පිණිස දෙවියන් වහවන්සේ පෙර නියම කළ සේක."

ජන්ම පාපයෙන් නිදොස්ව, පාප රහිතව මෙලොවට පැමිණි අප සමිඳාණන් මනුෂ්‍යයා නිසා පාපය වැළඳ ගත් සේක. නමුත් තම ජීවිතය මිදීමේ මිළයක් කොට පවරා දෙමින් පාපයේ මිළය ගෙවූ සේක. ඔවුන් වහන්සේ කරණ කොට ගෙන දේව පුත්‍රභාවයේ උරුමය අපට ලැබී ඇත.

ළඟ සිටින දෙදෙනෙකු සමඟ බෙදා ගන්න.

i ප්‍රේමයෙන් ඔවුන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධව ද, නොකැළැල්ව ද සිටින පිණිස ලෝකය මැවීමට ප්‍රථමයෙන් අපව තෝරා ගැනීම පිළිබඳව ඔබගේ අත්දැකීම කුමක්ද?

ii පිබිදුනු කිතුනුවෙකු ලෙස, පුබුදු ජීවිතය ගත කරන්නෙකු ලෙස සාක්ෂි දැරීමට අපට ලැබී ඇති විශේෂත්වය ගැන ඔබගේ අත්දැකීම කුමක්ද?

iii ප්‍රසාද ස්නාපනීය කැඳවීම හරහා අපට උරුම වී ඇති රාජකීය, පූජක, දිවැසිවර කැඳවීමට ශුද්ධාත්ම ගින්න ඇවිළුනු කෙනෙකු ලෙස සාක්ෂි දරන්නේ කෙසේදැයි බෙදා ගන්න.

වචනයේ සේවකයා සඳහා :

* 2018 වසර ශුද්ධාත්ම මංගල මහෝත්සව රාත්‍රිය අපට ඉතාමත් සුවිශේෂී වූවාය. ඒ මන්දයත් පසුගිය වසර තුළ අපට ලැබුණු වචනය ක්‍රියාවට නංවමින් අළුත් ජනතාවක් සමඟ මෙම මංගල රාත්‍රියේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමේ භාග්‍ය ලැබීම අපට ඉමහත් ආශිර්වාදයක් විය.

* එදින රාත්‍රි මංගල දිව්‍ය පූජෝත්සවයේදී පියතුමාගේ දේශනය තුළ පුබුදු ජනතාවට දෙවියන් වහන්සේ දක්වා ඇති විශේෂත්වය පිළිබඳව අපව තෝරා ගැනීම, වෙන්කර ගැනීම පිළිබඳව බෙදා ගත් වචනය ද ඉතාම ප්‍රශංසනීයයි. 'ඔබට විතරක් ඒ ආශිර්වාදය, ඒ ගින්න ඇවිළුවේ මොකද කියලා මට නම් හරිම පුදුමයි. හැම මොහොතකම ඔබ අතරට එන හැම අවස්ථාවකම මට දැනුන දේ තමයි, ඔබව දෙවියන් වහන්සේගේ හදවතේ සමීප තැනක තියාගෙන ඉන්නවා කියලා.'

* වසර 47ක් පුරාම කිතු දන පුබුදු අත්දැකීම හරහා ශ්‍රී ලංකා දේශයට දෙවියන් වහන්සේ තෑගි කර ඇති මහත් දේ පිළිබඳව සාක්ෂි කරුවෙකු බවට පත් වන්නට අපව තෝරා ගැනීම පිළිබඳව නිරතුරු ස්තුති ප්‍රශංසා කළ යුතුය. තවද ඒ අත්දැකීම සභාවට, රටට රැගෙන යාමේ ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමේ ආශිර්වාදිත ජීවිතයක් ගත කිරීමේ , ආශිර්වාදිත ගමනෙහි යෙදෙන්නන් ලෙස ,

i දිව්‍ය පූජාවට සුදු ඇඳීම
ii සාංඝික ජීවිතය ගත කිරීම
iii සරල අල්පේච්චිත ජීවිතයක් ගත කිරීම
iv ක්‍රිස්තුන් වහන්සේව ජීවිතයේ සමිඳාණන් කර ගත් ජීවිතයක් ගත කිරීම
v භාග්‍යවන්ත අම්මා මෙන් හිස් භාවයට ගමන් කිරීමට අවදියෙන් සිටිය යුතුය.

04. අවසාන ප්‍රශංසාව : ශු.ජොහාන් 15:16

**"ඔබ මා තෝරා ගත්තේ නැත, මම ඔබ තෝරා පත්කර ගත්තෙමි."**

කිසිවෙකුට කිසිදා ලැබිය නොහැකි ආශිර්වාදිත ජීවිතයක් ගත කරන්නට, අපව සොයා එමින් තෝරා පත් කළ දෙවි මහෝත්තමයාණන්ට අපි ස්තුති ප්‍රශංසා කරමු.
පුබුදු ගී අංක 95 "ඔබ තෝරා ගත්....."

******************************